*සැ. යු.* - 2013.12.27 දින පළ වූ අංක 1,843 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,844 - 2014 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2014.01.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 20 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 22 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 25 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 28 |

*සැ. යු.* - තාක්ෂණ සහ සමාජ සේවා වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 දෙසැම්බර් මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජනවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

19 - B 80798 - 2,950 (2013/12)
B4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2014*

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2014 ජනවාරි මස 23 වැනි දින පස්වරු 2.00 දක්වා අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම්පත්‍ර කාර්යාල වේලාවන් තුළ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250 ක (රුපියල් දෙසීය පනහක) මුදලක් ගෙවා, 2014 ජනවාරි මස 22 වැනි දින මධ්‍යහ්න 12.00 තෙක් ලබාගත හැක.

*උපලේඛනය*

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබාගත හැකි ස්ථාන* | *මිල ගණන් භාරගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | දිගන | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (මධ්‍යම පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (මහනුවර) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (මධ්‍යම පළාත) පළත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගන්නොරුව, පේරාදෙනිය | තෙල්දෙනිය | 2014 පෙබරවාරි 01 |
| එම | නුවරඑළිය | කොත්මලේ බිම්සවිය | පළත් සර්වේයර් ජනරාල් කාර්යාලය(මධ්‍යම පළාත) /දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (නුවරඑළිය) | එම | කොත්මලේ | 2014 පෙබරවාරි 01 |
| බස්නාහිර පළාත | ගම්පහ | ජාඇල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත) /දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (ගම්පහ) | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත), සර්වේයර් ජනරාල් කාර්යාලය, කිරුල පාර, කොළඹ 05 | ජාඇල | 2014 පෙබරවාරි 01 |
| එම | ගම්පහ | කටාන මීගමුව (බිම් සවිය) | එම | එම | කටාන | 2014 පෙබරවාරි 01 |
| එම | ගම්පහ | මහර කැළණිය (බිම් සවිය) | එම | එම | වැලිවේරිය/ මහර | 2014 පෙබරවාරි 01 |

කවරයේ ඉහළ වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිල ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තර ද සහිතව 2014 ජනවාරි 23 දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකි ය.

සර්වේයර් ජනරාල්.

කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

01-99

## මහාධිකරණය - කුරුණෑගල

### අධිකරණවල රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම

පහත සඳහන් අධිකරණයන්හි රාජසන්තක කරන ලද වාහන පහතින් දක්වා ඇති අධිකරණයන්හි දී 2014.01.06 දිනට පසු අදාළ අධිකරණයන්හි රෙජිස්ට්‍රාර්වරුන් මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇති අතර, මීට අදාළ ටෙන්ඩර් ලියකියවිලි කුරුණෑගල මහාධිකරණය මගින් 2014.01.07 වැනි දින සිට 2014.01.21 දින දක්වා නිකුත් කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 100 ක පෝර්ම ගාස්තුවක් කුරුණෑගල මහාධිකරණයට ගෙවිය යුතු ය. මීට අමතරව රු. 10,000 ක ආපසු ගෙවන ඇප තැන්පත් මුදලක් ටෙන්ඩර් පෝර්ම ලබා ගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ය. අනෙකුත් විස්තර හා කොන්දේසි ටෙන්ඩර් ලියවිලි සමග ඔබට සපයනු ලැබේ. සියලුම මුදල් ගෙවීම් කටයුතු මහාධිකරණ කාර්යාල දිනයන් හි දී පෙ. ව. 8.30 සිට ප. ව. 3.00 දක්වා සිදුකළ හැක.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | පරීක්ෂා කළ හැකි ස්ථානය | පරීක්ෂා කිරීම සඳහා අවසර ලබාගත යුතු නිලධාරියා |
|---|---|---|---|---|
| 01. | 65346 | 226-9179 අංක දරන ටොයොටා වර්ගයේ ලොරි රථය | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස | රෙජිස්ට්‍රාර් |
| 02. | 22044/2010 | ලියාපදිංචි නොකළ කුබෝටා - 1501 වර්ගයේ අත්ට්‍රැක්ටරය | මහෙස්ත්‍රාත් අධිකරණය, පොල්ගහවෙල | රෙජිස්ට්‍රාර් |
| | ඒ 447/2011 | NWTR -4392 අංක දරන TVS යතුරු පැදිය | එම | |
| | ඒ 731/2012 | DDDZLZNWH 02552 හා වැසි DMMBNHT 8803 අංක දරන යතුරු පැදිය | එම | |
| 03. | 25444/MISE/10 | අංක 68-4473 අංක දරන කැන්ටර් වර්ගයේ ලොරි රථය | මහෙස්ත්‍රාත් අධිකරණය, පොල්ගහවෙල | රෙජිස්ට්‍රාර් |
| | 5262/MISE/12 | එන්ජින් අංක RT 140-079664 හා චැසි අංක AC 12-3003 දරන කුබෝටා වර්ගයේ අත්ට්‍රැක්ටරය | එම | |
| 04. | B/ 258/12 | අංක 47-5868 දරන ටාටා වර්ගයේ ලොරි රථය | මහෙස්ත්‍රාත් අධිකරණය හෙට්ටිපොල | රෙජිස්ට්‍රාර් |
| 05. | AR 508/2010 | NWTE - 2861 බජාජ් ඵල්සර් වර්ගයේ යතුරු පැදිය | මහෙස්ත්‍රාත් අධිකරණය, වාරියපොල | රෙජිස්ට්‍රාර් |
| | AR 173/2011 | MT 2303 සුසුකි GN 125 යතුරු පැදිය | එම | |
| | 86259 | NWTJ 4212 බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරු පැදිය | එම | |
| 06. | 50299 | අංක 40-0908 අංක දරන ඉසුසු වර්ගයේ ලොරි රථය | මහෙස්ත්‍රාත් අධිකරණය කුලියාපිටිය | රෙජිස්ට්‍රාර් |

සභාපති-මහාධිකරණ විනිසුරු,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය - කුරුණෑගල.

2013 දෙසැම්බර් මස 18 වැනි දින,
කුරුණෑගල මහාධිකරණයේ දී ය.
01-174

# බඩු බාහිරාදිය විකිණීම්

### පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

භාවිතයෙන් ඉවත්කරන ලද අබලි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ භාවිතා කරන ලද පහත සඳහන් අබලි භාණ්ඩ 2014.01.21 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අමාත්‍යාංශ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ. අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වරයාගේ නිසි අවසරය ලබාගෙන 2014.01.20 වැනි දින ප. ව. 1.00 සිට ප. ව. 4.00 දක්වා මෙම වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කළ හැක.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අමාත්‍යාංශ පරිශ්‍රයෙන් ඉවත්කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන තැනැත්තන් අනිවාර්යෙන් ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යාංශය විසින් තබන ලද අවම ලංසුව පිළි නොගන්නා අවස්ථාවලදී අමාත්‍යාංශයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අමාත්‍යාංශය සතුව පවතී.

මේ පිළිබඳ වැඩි විස්තර දුරකථන අංක 011-2541379 ඔස්සේ රාජකාරි දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා ගණකාධිකාරී (සැපයීම්) වෙතින් විමසීමෙන් ලබාගත හැක.

ලේකම්,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

අංක 45, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

**අබලි භාණ්ඩ ලේඛනය - 2013**

| *අංකය* | *අයිතමය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | සී. පී. යූ. | 45 |
| 2. | මොනිටර් | 37 |
| 3. | යූ. පී. එස්. | 43 |
| 4. | මුද්‍රණ යන්ත්‍ර | 37 |
| 5. | ෆැක්ස් යන්ත්‍ර | 10 |
| 6. | දුරකථන අභ්‍යන්තර | 38 |
| 7. | වායු සමීකරණ යන්ත්‍ර කොටස් | 19 |
| 8. | දුරකථන සාමාන්‍ය | 6 |
| 9. | පවර් කේබල් | 4 |
| 10. | වයර් කෝඩ් | 13 |
| 11. | පෙන්ඩ්‍රයිව් | 6 |
| 12. | බිත්ති ඔරලෝසු | 2 |
| 13. | කැසට් රෙකෝඩර් | 2 |
| 14. | පරිගණක පුටු | 6 |
| 15. | විධායක පුටු | 12 |
| 16. | ලිපිකරු පුටු | 7 |
| 17. | මාණ්ඩලික පුටු - උස ඇඳි සහිත | 5 |
| 18. | මාණ්ඩලික පුටු - සාමාන්‍ය ඇඳි සහිත | 4 |
| 19. | ඇඳි සහිත පුටු | 6 |
| 20. | වෙනත් පුටු | 7 |
| 21. | රැහැන් රහිත දුරකථන | 5 |
| 22. | ස්ටූල් | 2 |
| 23. | විදුලි කේතල | 4 |
| 24. | අන්තර්ජාල ඩොංගල් | 3 |
| 25. | හදිසි විදුලි ලාම්පු | 4 |
| 26. | කාර්යාල ගමන් මලු | 3 |
| 27. | පාදස්තල විදුලි පංකා | 10 |
| 28. | හඬ පටිගත කිරීමේ යන්ත්‍ර | 2 |
| 29. | බොයිලේරුව | 2 |
| 30. | උණුවතුර බෝතල් | 4 |
| 31. | අන්තර්ජාල රවුටර් | 3 |
| 32. | ජෝගු | 4 |
| 33. | යතුරු ලියනය | 2 |
| 34. | පරිගණක යතුරු පුවරුව | 43 |
| 35. | ජනේල තිරරෙදි | 58 |
| 36. | දොර | 2 |
| 37. | දැන්වීම් පුවරු | 3 |
| 38. | දාඩ තැටි | 1 |
| 39. | විදුලි උඳුන | 1 |
| 40. | සී. ඩී. එම්. ඒ දුරකථන | 23 |
| 41. | ඩොට්මෙට්‍රික් මුද්‍රණ යන්ත්‍ර | 1 |
| 42. | ජංගම දුරකථන | 19 |
| 43. | ලැප්ටොප් පරිගණක | 5 |
| 44. | අල්මාරි | 3 |
| 45. | ෆයිල් ට්‍රේ | 8 |
| 46. | ඩිස්කට් රැඳවුම් පෙට්ටි | 1 |
| 47. | මේස | 20 |
| 48. | තිරරෙදි රැඳවුම් කොපු | 1 |
| 49. | කඩබි | 9 |
| 50. | ඩිජිටල් කැමරා | 2 |
| 51. | ඡායා පිටපත් යන්ත්‍ර | 3 |
| 52. | ස්කැනර් යන්ත්‍ර | 2 |
| 53. | 3' x 4' ලෑලි | 1 |
| 54. | බල වර්ධක | 1 |
| 55. | බූස්ටර් | 2 |
| 56. | වේවැල් ලිපිගොනු රාක්ක | 1 |
| 57. | සිවිලිම් බල්බ කොටස් | 1 |
| 58. | විදුලි ධාරා හුවමාරි ස්විචය | 1 |
| 59. | කුෂන් මෙට්ට | 5 |
| 60. | ඇන්ටනා තැටි | 1 |
| 61. | දොරවස්නා | 3 |
| 62. | ලාම්පු ආවරණය | 3 |
| 63. | මයික් වයර් | 1 |
| 64. | මොඩමය | 1 |
| 65. | එම් පී 3 ප්ලේයර් | 1 |
| 66. | පින්තූර රාමු | 10 |
| 67. | පයිප්ප ඇල්ලුම් යන්ත්‍ර | 2 |
| 68. | ප්ලාස්ටික් මල් පැල | 1 |
| 69. | ලී ස්ක්‍රීන් | 1 |
| 70. | සෝදන බේසම | 1 |
| 71. | සවුන්ඩ් බ්ලාස්ටර් | 2 |
| 72. | මේස රෙදි | 1 |
| 73. | ස්ථාවර දුරකථන රඳවන පෙට්ටි | 1 |
| 74. | ටියුබ් බල්බ | 1 |
| 75. | වේවැල් බිත්ති සැරසිලි | 2 |

01-48

## පොල්ගහවෙල මහෙස්ත්‍රාත් අධිකරණය

### රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණයේ නඩුකරයන්ට අදාළව නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍යයන් අතරින් රාජ සන්තක කිරීමට යටත් වූ හා හිමිකම් නොපෑ පහත සඳහන් ද්‍රව්‍යයන් 2014 පෙබරවාරි මස 09 වැනි දින පෙ. ව. 10.00 සිට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් යමකට හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසි දින වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය වෙන්දේසි දින දී වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙරාතුව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා නිරීක්ෂණය කළ හැකි ය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගැනෙන අවස්ථාවක දී අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එදිනම ඉවත් කර ගත යුතු අතර, මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

භාණ්ඩ වෙන්දේසියේ දී භාණ්ඩ ඉල්ලුම් කරන්නන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු ය.

බුද්ධික සී. රාගල,<br>
මහෙස්ත්‍රාත්,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
පොල්ගහවෙල.

2013 දෙසැම්බර් මස 18 වැනි දින,<br>
පොල්ගහවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 22043/MISE/10 | එන්ජින් අංක GA 85- 036213 දරන K700 කුබෝටා වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 02. | 2782/MISE/12 | SGGA 9834 සී ෆැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 03. | 4550/MISE/12 | NWSC 6407 දරන අත්ට්‍රැක්ටරය |
| 04. | 7280/MISE/13 | ට්‍රැක්ටර් ටේලර් 01 යි |
| 05. | 61805/EX/06 | අංක 201-5408 දරන ත්‍රී රෝද රථය |
| 06. | 26146/E/10 | චැසි අංක F 5B 830677 දරන යතුරුපැදිය |
| 07. | A 1785/13 | King - Star off Road වර්ගයේ නිල් සහ කහ මිශ්‍රපාට පා පැදිය |
| 08. | A 207/11 | පාපැදි 01යි |
| 09. | A 1786/13 | මදර් බෝඩ් 01යි, සර්කිට් 01යි, INTEX රිමොට් 01යි, කලු පාට පටි 01යි, RAME DRIVE 01යි, ජැක් එක සහිත වයර් කෝඩ් 01යි. චාජර් 01යි, බෆල් 01යි |
| 10. | 4856/PC/12 A(B 339/11) | කලු පැහැති හිස් වැස්ම, නොකියා වර්ගයේ ජංගම දුරකථනය, කලු පාට ජංගම දුරකථනය, කලු පාට පාවහන් යුගල |
| 11. | 9302 | සවල් 01යි |
| 12. | 2269/11 | සවල් 01යි |
| 13. | 9268/13 | ෆෝන් චාජරය |
| 14. | 1189/11 | බේසම් 01යි |
| 15. | 9535/13 | වේවැල් කූඩ 02යි |
| 16. | 9547/13 | මල්ටි ෂොකට් 01යි |
| 17. | 9550/13 | රීචාජබල් ටෝච් 01යි |
| 18. | 9551/13 | රිචාජබල් ටෝච් 01යි |
| 19. | 9694/13 | ඇලුමිනියම් කල 01යි, ඇලුමිනියම් මුට්ටි 01යි |
| 20. | 9817/13 | රිචාජබල් ටෝච් 01යි |
| 21. | අංක රහිත | මේස තරාදි 01යි |
| 22. | අංක රහිත | අත් පොරව 01යි |
| 23. | අංක රහිත | අත් පොරව 01යි |
| 24. | අංක රහිත | අත් පොරව 01යි |
| 25. | අංක රහිත | පොරව තල 01යි |
| 26. | අංක රහිත | පොරව 01 යි |
| 27. | අංක රහිත | වැය 01 යි |
| 28. | අංක රහිත | මිට කැඩී ගිය උදළු 01යි |
| 29. | අංක රහිත | විදුලි ඩ්‍රිල් 01යි |
| 30. | අංක රහිත | අත් කියත් 01යි |
| 31. | අංක රහිත | කුඩ 03යි |
| 32. | අංක රහිත | ටෝච් 01යි, නියන් 03යි, අඬු 01යි, ටෙස්ටර් 01යි, ග්ලවුස් 04ක් සහිත පාසල් බෑගය, |
| 33. | අංක රහිත | වයර් සහිත රෙගියුලේටර් 01යි |
| 34. | අංක රහිත | ගිරා 01යි, කතුරු 01යි, පීරිතල |
| 35. | අංක රහිත | මීටර් කෝදු 01යි |
| 36. | අංක රහිත | යකඩ කපන අඬු 01යි |
| 37. | අංක රහිත | මීටර් කෝදු 01යි |
| 38. | අංක රහිත | නියන් 01යි |
| 39. | අංක රහිත | වතුර මෝටර් 01යි |
| 40. | අංක රහිත | නියන් 01යි |
| 41. | අංක රහිත | මෝල්ගස් 01යි |
| 42. | අංක රහිත | දිග මිට සහිත කිරි පිහිය 01යි |
| 43. | අංක රහිත | කොළපාට පිගන් 05යි |
| 44. | අංක රහිත | කොළපාට දීසි 04යි |
| 45. | අංක රහිත | දුඹුරුපාට දීසි 01යි |
| 46. | අංක රහිත | විදුරු මල් සහිත දීසි 01යි |
| 47. | අංක රහිත | අඬු කෝප්ප 03යි |
| 48. | අංක රහිත | පීරිසි 03යි |
| 49. | අංක රහිත | විදුලි පන්දම් 01යි |
| 50. | අංක රහිත | බැටරි 01යි |
| 51. | අංක රහිත | සවල් 01යි |
| 52. | අංක රහිත | සවල් 01යි |
| 53. | අංක රහිත | යකඩ ඉනි 01යි |
| 54. | අංක රහිත | උස යකඩ ඉනි 01යි |
| 55. | අංක රහිත | යකඩ ඉනි 01යි |
| 56. | අංක රහිත | කුඩා යකඩ ඉනි 01යි |
| 57. | අංක රහිත | යකඩ ඉනි 01යි |
| 58. | අංක රහිත | යකඩ ඉනි 01යි |
| 59. | අංක රහිත | දැති 01යි |
| 60. | අංක රහිත | ටෙන්ඩර් පෙට්ටි 01යි |
| 61. | අංක රහිත | මොබි බ්‍රස් 01යි |
| 62. | අංක රහිත | මෝල් ගස් 01යි |
| 63. | 9940/13 | කාන්තා පර්ස් 01යි |
| 64. | 9861/13 | දුරකථන චාජරය |
| 65. | 10096/13 | දුරකථන චාජරය |
| 66. | 10187/13 | කාන්තා අත් ඔරලෝසු 01යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 67. | B 473/12 (B 385/11) | පිහි 01යි |
| 68. | 10431/13 | අත් ඔරලෝසු 01යි |
| 69. | 10436/13 | රිචාර්ජබල් ටෝච් 01යි |
| 70. | 10530/13 | සවල් 01යි, බාල්දි 01යි |
| 71. | 7899/13 | කොළපාට තින්තා පැදුරු 01යි |
| 72. | 7779/13 | තින්තා පැදුරු 01යි |
| 73. | 7486/13 | තින්තා පැදුරු 02යි |
| 74. | 7065/13 | අත් කියත් 01යි, නියන් 01යි, අතකොලු 01යි, අඬුමිට් 01, ග්‍රිල් මැෂින් 01යි |
| 75. | 8487/13 | ළමා මසා නිමකළ ගවුම් 01යි |
| 76. | 8492/13 | ළමා නිමි ඇඳුම් 01යි |
| 77. | 8494/13 | ළමා නිමි ඇඳුම් 01යි |
| 78. | 21235/10 | තරාදි 01යි |
| 79. | බී. 2199/13 | පොල්ගෙඩි 08 යි |
| 80. | බී 1910/13 | පොල්ගෙඩි 27 යි |
| 81. | 10297/13 (බී.1867/13) | පොල්ගෙඩි 80 යි |
| 82. | 9907/13 (බී. 1730/13) | පොල්ගෙඩි 13 යි |
| 83. | 8002/13 (බී 1428/13) | පොල්ගෙඩි 32යි |
| 84. | 9917/13 | යකඩ බැරල් 01යි |
| 85. | 9711/13 | යකඩ බැරල් 01යි |
| 86. | 9363/13 | යකඩ බැරල් 01යි |
| 87. | 10616/13 | යකඩ බැරල් 01යි |
| 88. | 10321/13 | යකඩ බැරල් 01යි |
| 89. | 9452/13 | යකඩ බැරල් 01යි |
| 90. | අංක රහිත | හිස් ලොකු කෑන් 27යි |
| 91. | අංක රහිත | හිස් පොඩි කෑන් 13යි |
| 92. | අංක රහිත | හිස් වීදුරු බෝතල් 260 යි |

01-173

---

**මහාධිකරණය - කල්මුණ**

කල්මුණ මහාධිකරණයේ අවසන් වූ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩයන් 2014.01.22 වැනි දින ප. ව. 3.30 ට කල්මුණ මහාධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් හිමිකම් නොපාන භාණ්ඩයන් සම්බන්ධයෙන් හිමිකම් කියන්නෙකු වෙතොත් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින ප. ව. 2.30 සිට ප. ව. 3.30 දක්වා කාලය තුළ දී භාණ්ඩ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවිය යුතු අතර මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩයන් එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණිය යුතු ය.

මහාධිකරණ විනිසුරු,
කල්මුණ.

2013 දෙසැම්බර් මස 09 වැනි දින,
කල්මුණ මහාධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය පිළිබඳ විස්තර | අංකය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | HC/KAL/26/2008 | ලුමාලා වර්ගයේ පාපැදි | 57171108 | 01 |
| 02. | HC/KAL/53/02008 | යමහා වර්ගයේ යතුරු පැදි | 85 ශ්‍රී 3538 | 01 |
| 03. | HC/KAL/203/2011 | ලුමාලා වර්ගයේ පාපැදි | 68232085 | 01 |
| 04. | HC/KAL/126/2009 | ලුමාලා වර්ගයේ පාපැදි | 65373312 | 01 |
| 05. | HC/KAL/115/2009 | ඩ්‍රැගන් වර්ගයේ පාපැදි | HX 063687 | 01 |
| 06. | HC/KAL/115/2009 | ඩෙලෝ වර්ගයේ පාපැදි | 177407 | 01 |
| 07. | HC/KAL/115/2009 | ලුමාලා වර්ගයේ පාපැදි | 560638 | 01 |

01-131

# රජයේ නොවන දැන්වීම්

### ඇටර්නි බලය අවලංගු කිරීම

මත්තේගොඩ, මත්තේගොඩ නිවාස සංකීර්ණයේ අංක 10 බී 97/8 පදිංචි එස්. පී. බී. උපාලි ඉන්ද්‍රසේන වන මම පන්නල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. ජී. ඊරියගොල්ල ලියා සහතික කළ අංක 1780 හා 2006.07.25 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගේ ඇටර්නි බලකරු ලෙස ගෝනවිල මාකදුර පදිංචි සිල්පේස්තු පටබැඳිගේ රත්නසිරි යන අයට ලබාදී තිබූ අයිතිවාසිකම බලපුළුවන්කම සහ බලතල 2013.11.13 දින පටන් බල රහිත හා ශූන්‍ය කරන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

එන්. පී. බී. උපාලි ඉන්ද්‍රසේන.

01-03

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

හම්බන්තොට, තංගල්ල පාර, අංක 38 ලිපිනයේ පදිංචි ජා. හැ. ප. අංක 55690112 වී හිමි අන්දර මානගේ ගුණවතී වන මම, හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එස්. එෆ්. මවිලානා මහතා විසින් 2011.01.25 දින ලියා සහතික කරන ලද අංක 73 දරන ඇටෝර්නි බලපත්‍රයේ අධිපතියෙකු බව සඳහන් කරන අතර එමගින් බලය පැවරූ ඇටෝර්නි බලකරුවන හම්බන්තොට තංගල්ල පාර අංක 38 ලිපිනයේ පදිංචි අන්දර මානගේ චමිල තුෂාර ජා. හැ. ප. අංක 73068325 වී යන අයට ලබාදුන් ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරමි.

01-17

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1. සමාගමේ නම : පර්ල්ස්බරි ඉන්ටර්නැෂනල් (පීවීටී)එල්ටීඩී
2. අංකය : පී වී 95900
3. ලියාපදිංචි කළ දිනය : 2013.12.05
4. ලියාපදිංචි ලිපිනය : අංක 33, රොඩ්නි වීදිය, බොරැල්ල, කොළඹ 08.

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
සමාගමේ ලේකම්.

පර්ල්ස්බරි ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී,
නීතිඥ සමාගමේ ලේකම්.

01-23

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි :-

සමාගමේ නම : ක්ලියර් රෝඩ් ට්‍රාන්ස්පෝට් ඇන්ඩ් ට්‍රැවලින් පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පී. වී. 74189
ලියාපදිංචි ලිපිනය : අංක 9, රීගල් හෝම්ස්, මත්තේගොඩ, පොල්ගස්ඕවිට.

01-24

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීමයි

සමාගමේ නම : කොමන් එජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 95667
සංස්ථාගත කිරීමේ දිනය : 2013.11.21
ලියාපදිංචි කාර්යාලය : අංක 77, ශ්‍රීමත් ලෙස්ටර් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. එස්. ටී. මිරිහාන,
සමාගමේ ලේකම්.

01-25

---

### දැන්වීමයි

සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගමේ නාමය : චමීග (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 95726
සංස්ථාගත කළ දිනය : 2013 නොවැම්බර් මස 25 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 12/2 ඒ, පෙරේරා ඇවනිව්, කොහුවල, නුගේගොඩ.

අධ්‍යක්ෂ.

01-31/1

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : අස්ඩෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 189, පරණ යෝන් වීදිය, කොළඹ 12
ලියාපදිංචි අංකය : පී වී 93290
ඉදිරිපත් කිරීම : අධ්‍යක්ෂක.

එච්. ටී. පී. බිස්නස් සර්විසස් (පීවීටී)එල්ටීඩී .

තුන්වැනි මහල,
බටහිර කුළුණ, මෙතෝඩිස්ට් ගොඩනැගිල්ල,
අංක 2/5, දුම්රියපොල පාර,
කොළඹ 03.

01-34

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ස්මාර්ටෙක්ස් හෝම් ටෙක්ස් ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : 33/23, හේකිත්ත පටුමග, හේකිත්ත පාර, වත්තල
ලියාපදිංචි අංකය : පී වී 93209
ඉදිරිපත් කිරීම : අධ්‍යක්ෂක.

එච්. ටී. පී. බිස්නස් සර්විසස් (පීවීටී).

එල්ටීඩී, තුන්වැනි මහල,
බටහිර කුළුණ, මෙතෝඩිස්ට් ගොඩනැගිල්ල,
අංක 2/5, දුම්රියපොල පාර,
කොළඹ 03.

01-35

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ස්විස් මර්චන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 95846
සංස්ථාගත කළ දිනය : 2013 දෙසැම්බර් මස 03
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 31, ෆ්‍රාන්සස් පාර, කොළඹ 06.

අධ්‍යක්ෂ.

01-44

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගම සංස්ථාගත කිරීම

සමාගමේ නම : ඒස්ලින්ක් (පීවීටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී වී 95664
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 531/1, ලේක් පාර, අකුරෙගොඩ, බත්තරමුල්ල
සංස්ථාගත කළ දිනය : 2013.11.21

කේ. බී. මනතුංග,
ලේකම්.

01-46

---

### ඇටෝර්නි බලපත්‍රයෙන් මා දුන් බලය අවලංගු කිරීම

පානදුර, අලුබෝමුල්ල, මහගෙදරවත්ත, අංක 237/37, දරන ස්ථානයේ පදිංචි දොඩම්ගොල්ලගේ හේමන්ත් ප්‍රදීප ජයසේකර වන මම ජාඇල කපුවත්ත, කන්‍යාරාම පාරේ අංක 80 දරන ස්ථානයේ හි පදිංචි නම්බුකාර ගමගේ ප්‍රියන්ති සහ ජා-ඇල කපුවත්ත, කන්‍යාරාම පාර, අංක 80 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් අස්රොෆ් ආම්ජාඩින් යන අය මාගේ ඇටෝර්නි බලකරුවන් වශයෙන් පත් කරමින් ඩබ්ලිව්. මාලිකා එන්. ධනුසේකර ප්‍රසිද්ධ නොතාරිස් තැන 2012.05.11 වැනි දින සහතික කළ අංක 3378 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මා විසින් දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරන මෙන් මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. එය මත මින් ඉදිරියට මා වෙනුවෙන් ඔවුන් විසින් කරන ලද කිසිදු කටයුත්තකට මම වග නොකියන බව ප්‍රකාශ කරමි.

දොඩම්ගොල්ලගේ හේමන්ත් ප්‍රදීප ජයසේකර,

අංක 237/37, මහගෙදරවත්ත,
අලුබෝමුල්ල, පානදුර.

01-47

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි

වර්ෂ 2013.12.04 වැනි දින ඇටොම් එම් වී ඉලෙක්ට්‍රික් (පී වී ටී) එල්ටීඩී නමින් සමාගමක් පනාගොඩ, ටෙම්පල්ස්බර්ග් කාර්මික උද්‍යානය, අංක 26 හි සංස්ථාගත කර ඇති බවත් එකී සමාගමේ ලියාපදිංචි අංක පී වී 95886 බවත් ශ්‍රී ලංකා වාසි ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. විජිත මනම්පේරි,
සමාගම් ලේකම්.

01-93

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කොට ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ද මිරකල් අයිලන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 95998
ලියාපදිංචි ලිපිනය : අංක 295/1/2/1, 2 වැනි මහල, ස්ටැන්ලි තිලකරත්න මාවත, ජුබිලි කණුව, නුගේගොඩ.
සංස්ථාගත කළ දිනය : 2013 දෙසැම්බර් මස 11 වැනි දින.

සමාගමේ ලේකම්.

01-97

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 05 වගන්තිය අනුව පුද්ගලික සමාගමක් ලෙස පහත සඳහන් ආයතනය 2013.10.14 වැනි දින සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : ලංකා ෆයින් පෝසිලේන් (පුද්.) සමාගම
සමාගම් අංකය : පී වී 95044
ලිපිනය : අංක 324/1 ඒ, මොරටුව පාර, උද්යෝගිපුර, සුවාරපොල, පිළියන්දල.

Lanka Fine Porcelain (Pvt) Ltd.

01-80

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පානදුර පිංවත්තේ පිරිවෙන පාරේ පදිංචි ලියනමහදුර සංජීව ප්‍රසාද් සිල්වා වන මා විසින් ඩබ්ලිව්. ඩී. පී. නිපුනිකා ද සිල්වා කරුණාතිලක ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කරන ලද අංක 42 සහ 2011.07.18 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් පතකර ඇත්තා වූ ඇටෝර්නි බලකරු වන ලියනමහදුර හිමිඩට් සිල්වා නොහොත් ලියනමහදුර හියුබට් ද සිල්වාට (ජා. හැ. අංකය 350652590 V) ලබාදී ඇති ඇටෝර්නි බලය මෙයින් අවලංගු කර විලෝපනය කර 2013.12.06 වැනි දින සිට විසුරුවා හැර ඇති බැවින් ඉහත ඇටෝර්නි බලකරු විසින් එකී බලය ප්‍රකාරව ගන්නා ක්‍රියාමාර්ග මින් ඉදිරියට වලංගු නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත මින් දන්වා සිටිමි.

ලියනමහදුර සංජීව ප්‍රසාද් සිල්වා,

පිරිවෙන පාර,
පිංවත්ත,
පානදුර.

01-81

---

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

වත්තල, මාබෝල, සිංහ පාර, අංක 34 හි පදිංචි කතිරවෙල් රවීද්‍රන් නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වේලුපිල්ලෙයි සිත්තම්පලම් ගනේෂලිංගම් විසින් සහතික කරන ලද 2011 අගෝස්තු මස 09 දිනැති අංක 460 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය දැනට ඕස්ට්‍රේලියාවේ NSW 2194 කැම්ප්සි, ක්ලෙයාමොන්ට් ස්ට්‍රීට්, අංක 6/31 හි පදිංචි (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කීරමලෙයි, කන්කසන්තුරෙයි පාර, අංක 119) කත්තර් කාරාලසිංහම් සහ මෝහනංගි කාරාලසිංහම් වන අපි ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව වෙත සහ මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කතිරවෙල් රවීද්‍රන් විසින් අප උදෙසා සහ වෙනුවෙන් කරනු ලැබිය හැකි වන යම් දෙයක් වෙනුවෙන් අපි වගකීම භාර නොගන්නවා ඇත.

කත්තර් කාරාලසිංහම් සහ
මෝහනංගි කාරාලසිංහම්.

2013 ඔක්තෝබර් මස 10 වැනි දින දී ය.

01-136

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කොට ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : වොයිස් ලංකා (පුද්.) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 74349
ලියාපදිංචි ලිපිනය : අංක 97/3, බුලුගොහතැන්න, අකුරණ, මහනුවර. ශ්‍රී ලංකා
සංස්ථාගත කළ දිනය : 2010.09.15.

ලේකම්.

01-118

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම, 2013 නොවැම්බර් මස 13 වැනි දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : එමර්සන් ඉලෙක්ට්‍රික් කම්පැනි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92625
ලියාපදිංචි කාර්යාලය : 218 ද සේරම් පෙදෙස, කොළඹ 10, ශ්‍රී ලංකාව

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

එමර්සන් ඉලෙක්ට්‍රික් කම්පැනි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

01-159

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) දරන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : බ්ලැක්ලයන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 18, කුලතුංග පාර, පානදුර
ලියාපදිංචි අංකය : පී වී 95772
සංස්ථාගත කිරීමේ දිනය : 2013.11.27

ආර්. කේ. ජයවීර මහත්මිය,
සමාගම් ලේකම්.

01-119

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

මාක් ඇක්ටිව් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් එක් බිලියන හාරසිය දාහත් මිලියන දෙසිය පනස් හයදහස් තුන් සියයේ (ශ්‍රී ලංකා රු. 1,417,256,300) සිට රුපියල් එක් බිලියන අනූ මිලියන හාරසිය තිස් එක් දහස් තුන් සියය (ශ්‍රී ලංකා රු. 1,090,431,300) දක්වා වූ යෝජිත අවකරණය කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රසිද්ධ නිවේදනයක් කරනු ලැබේ.

මාක් ඇක්ටිව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ මණ්ඩලය.

01-166

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ත්‍රිශූල් බී ටී එල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82093
ලියාපදිංචි කාර්යාලය : අංක 5/3, පොලිස් පාක් ටෙරසය, කොළඹ 05
ලියාපදිංචි දිනය : 2011.10.24

සමාගමේ ලේකම්වරු.

01-167/1

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : මාලබේ පුංචි වාහන පොළ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 62989
ලියාපදිංචි කාර්යාලය : අංක 506/7, තලංගම උතුර, බත්තරමුල්ල
ලියාපදිංචි දිනය : 2008.02.08

සමාගමේ අධ්‍යක්ෂවරු.

01-167/2

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ (9) 2 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම නම වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැරණි නම : මාලබේ පුංචි වාහන පොළ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 62989
ලියාපදිංචි කාර්යාලය : අංක 506/7, තලංගම උතුර, බත්තරමුල්ල
සමාගමේ අලුත් නම : මාලබේ වාහන පොළ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම වෙනස් කළ දිනය : 2008.05.28

සමාගමේ ලේකම්වරු.

01-167/3

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ (9) 2 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම නම වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැරණි නම : මාලබේ වාහන පොළ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 62989
ලියාපදිංචි කාර්යාලය : අංක 311, කඩුවෙල පාර, මාලබේ
සමාගමේ අලුත් නම : මාලබේ පුංචි කාර් නිවස (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම වෙනස් කළ දිනය : 2010.08.04

සමාගම් ලේකම්වරු.

01-167/4

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම

### මහජන බැංකුව - වෙන්නප්පුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වෙන්දේසි යෝජනා දැන්වීම

**වටිනා දේපළක් වෙන්දේසියේ විකිණීම**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ග්‍රාමයේ පිහිටි මකුල්ලගහවත්ත, කෝන්ගහවත්ත, දත්පතහෙකෝන්ගහ ගොඩබිම සහ මාදන්ගහහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. එච්. ඊ. මෙන්ඩිස් විසින් මැන සාදන ලද 1987.07.05 දිනැති අංක 4585 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් අංක 01, 02,03,04 සහ 05 දරන ඒකාබද්ධ ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

ඉඩම ප්‍රමාණයෙන් අක්කර 02, රූඩ් 02, පර්චස් 17.6

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2014 ජනවාරි මස 28 වැනි අඟහරුවාදා දින පෙ. ව. 11.00 ට අප විසින් දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.04.12 වැනි දින ද, දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් වල 2002.03.27 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මීගමුව - හලාවත පාරේ වෙන්නප්පුව නගරයෙන් දකුණට ඇති අලුත් පාරේ (ලුනුවිලට යන පාර) සැතපුම් 1ක් පමණ ගියවිට පාරේ වම්පස කිඹුල්ගාල ක්‍රීඩාංගනයට යාබදව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.:-

1. ගැණුම් මිලෙන් 10%ක් ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අදිකාරියට 1%ක් ;
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ;
4. ලිපිකරුගේ සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500;
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් ඒ සෑම;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (1 වන මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 032-225330, 032-2253301, ෆැක්ස් අංකය : 032-2255247.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි ය.

පෙර දැනුම්දීමකින් තොරව ඉහත වෙන්දේසිය නවතා ගැනීමේ/අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා වෙන්දේසි ශාලාව :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංක :011-2588176
ඊ මේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය :www.sandslanka.com

01-116

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2014 ක් වූ ජනවාරි මස 23 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුරේ, කළුතර බැද්ද කළුතර නගර සභා සීමාව තුළ කළුතර දේශාත්‍ර, පන්සල පාරේ පිහිටි වරිපනම් අංක 179/ඒ, "අමරකෝන්වත්ත" නමැති ඉඩමට බලයලත් මානක වයි පී ද සිල්වා විසින් මැන සාදන ලද අංක 555 "ඒ" සහ 1994 ජූලි මස 21 දිනැති සැලැස්මේ ලොට් 2 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති කැබැල්ල සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් ය.

අංක 555 "ඒ" දරන පිඹුරේ ලොට් 09 මතින් මාර්ග අයිතිය ද සමග ද වේ.

විශාලත්වය : අ. 0 රූ. 0 පර්. 15.0

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2010.04.03 දිනැති අංක 1908 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම බන්ධනදායි ලෙස ඉලියවරිගේ සුදත් රෝහණ විසින් පැහැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.04.26 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඕලි පුවත්පත් සහ එදින ගැසට් පත්‍රය ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- කළුතර ඔරලෝසු කණුව අසල සිට ගාලු පාර ඔස්සේ කි. මී. 1 ක් පමණ උතුරු කළුතර මංසන්දිය දක්වා ගමන් කර, දකුණට හැරී පන්සල පාරේ මීටර් 350ක් පමණ (එතනමඩල පාරට මෙපිටින්) මෙම පාරේ දකුණු පසින් 179 "ඒ" දරන පරිශ්‍රය පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවේලේම පහත සඳහන් වියදම් මුදල් වලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලෙන් 10%ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (සියයට එකයි) වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000),

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90 % ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු සඳහා කළමණාකරු, ණය අය කරගැනීම් අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී ප්‍රධාන කාර්යාලය, අංක 450 ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4667227/011-2565573.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011-2873656, 0777-672082,
ෆැක්ස් අංකය : 011-2871184.

01-170

## ප්‍රසිද්ධ වෙන්දේසියයි

කොළඹ දිසා අධිකරණයේ අංක 17532/එම්. බී දරන නඩුවේ තීන්දු ප්‍රකාශය අනුව එම නඩුවේ සඳහන් පහත උපලේඛනගත දේපල විකිණීමට මා වෙත නිකුත් කර ඇති 2013.04.08 දිනැති විකිණීමේ ආඥාව හා අධිකාරි පත්‍රයේ බලය මත බැර කල යුතු මුදල් පහත සඳහන් උපලේඛන ගත දේපල විකුණා අය කිරීම සඳහා එකී නඩුවේ නඩු තීන්දුව හා තීන්දු ප්‍රකාශය හා විකිණීමේ ආඥාවට අනුකූලව පහත උපලේඛනගත දේපල පිහිටි ස්ථානයේදී 2014 පෙබරවාරි මස 01 දින පෙ.ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ මා විසින් විකුණනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ මාරවිල ඉඩම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සීමාවට අයත් දකුණු පිටිගල කෝරලේ කම්මල් පත්තුවේ උතුරු කම්මල පිහිටි තල්ගහවත්ත, සූරියගහවත්ත සියඹලාගහ වත්තේ කොටසක් කියන අක්කරයක් පමණ විශාල ඉඩම වර්ෂ 1982 ක් වූ මැයි මස 09 වන දින ටී. සී. එච්. ප්‍රනාන්දු අවසර ලත් මානක තැන විසින් මැන සකස් කරන ලද අංක 54/1982 ක් වූ දරන පිඹුර ප්‍රකාර දැනට තතන්ගහවත්ත කියන ඉඩමට මායිම් : උතුරට පාරද, ග්‍රසියානු ප්‍රනාන්දු යන සිමියොන් බ්‍රේස් සහ තවත් අයට අයිති ඉඩම සහ කැමිලස් කුරේලාගේ ඉඩමද, නැගෙනහිරට අන්තෝනි දාබරේගේ ඉඩමද, දකුණට අරෝගුස් දාබරේගේද ටී. දාබරේගේද ඉඩමද බස්නාහිරට එස්. ප්‍රනාන්දුට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුල රූඩ් දෙකයි පර්චස් තිස් පහ (අ. 0, රූ. 2, පර්. 35) ක් විශාල ඉඩමේ පිහිටි ගහකොල, පලතුරු සහ එහි පිහිටි සැමදේද එම ඉඩමට ගමනාගමනය කිරීමට පාරද වේ. මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 10/97 හි ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් ඉඩම නැවත මැනීමේදී පහත පරිදි විස්තර වේ.

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාල සීමාවට අයත් දකුණු පිටිගල කෝරලේ කම්මල් පත්තුවේ උතුරු කම්මල පිහිටි තල්ගහවත්ත සූරියගහවත්ත සියඹලාගහවත්තේ ඒ අක්ෂරය දරන ඉඩමේ කොටසක් වූ වර්ෂ 1996.08.11 දින ටී. සී. ප්‍රනාන්දු පුල්ලේ අවසර ලත් මානක තැන විසින් මැන සකස් කරන ලද අංක 1013 දරන පිඹුරේ ප්‍රකාර දැනට තතන්ගහවත්ත කියන ඉඩමට මායිම් : උතුරට පාර බ්‍රිජට් ප්‍රනාන්දුගේ සහ ඩොරීම් දාබරේගේ ඉඩමද, නැගෙනහිරට ඩොරින් දාබරේගේ සහ ජැනට් ප්‍රනාන්දුගේ ඉඩමද, දකුණට අන්තෝනි ප්‍රනාන්දු, ක්‍රිස්ටෝපර් පීරිස් සහ පුෂ්පා දාබරේගේ ඉඩම ද බස්නාහිරට සබීතා ප්‍රනාන්දුගේ ඉඩම ද මායිම් වූ රූඩ් දෙකයි පර්චස් තිස් පහ දශම එකයි බිංදුව (අ. 0, රූ. 2, පර්. 35.10) ක් විශාල ඉඩමේ ගහකොල, පලතුරු සහ එම ඉඩමේ පිහිටි සියලු දේද මෙම ඉඩමට ගමනා ගමන කිරීමට පාර ද වේ.

(1) මිටිය පහත හෙලන විට ඉහලම ලංසුව තබන මුදලින් 25% ක අත්තිකාරම් මුදල් සහ ආපසු නොගෙවනු ලබන 2 1/2% ක වෙන්දේසිකරුගේ ගාස්තුද
(2) දැන්වීම් ගාස්තු විකුණුම් කොන්දේසි පිලියෙල කිරීමේ හා මුද්දර ගාස්තු
(3) ප්‍රාදේශීය සභාවට /නගර සභාවට ගෙවිය යුතු 01% ක විකුණුම් බද්ද ද ගෙවිය යුතුය.

ඉතිරි 75% වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුලත අධිකරණයට ගෙවිය යුතු අතර වෙන්දේසිකරු නියම කරනු ලැබුවහොත් එසේ ගෙවන බවට සහතික විය හැක ඇප කරුවන් දෙදෙනෙකු වෙන්දේසි දිනයේදී ඉදිරිපත් කිරීමට ගැනුම්කරු බැදී ඇත.

වැඩි විස්තර සඳහා නීති නිලධාරි, ඒෂියා ඇසට් පිනෑන්ස් ලිමිටඩ්, අංක 76/1, ධර්මපාල මාවත, කොළඹ 07 හෝ සී. කුමාරසිංහ, වෙන්දේසිකරු , අංක 60/50, දෙල්ගහවත්ත පාර, පමුණුව, මහරගම යන අයගෙන් විමසන්න.

දුරකථන අංකය : 011-2746383

සී. කුමාරසිංහ,
වෙන්දේසිකාර තක්සේරුකරු උසාවි කොමසාරිස්.

01-169

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* <br> *රු. ශ.* | *තැපැල් ගාස්තුව* <br> *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** <br> *රු. ශ.* | **තැපැල් ගාස්තුව** <br> *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| ජනවාරි | 2014.01.03 | සිකුරාදා | 2013.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.10 | සිකුරාදා | 2013.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.17 | සිකුරාදා | 2014.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.24 | සිකුරාදා | 2014.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.31 | සිකුරාදා | 2014.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2014.02.07 | සිකුරාදා | 2014.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.13 | බ්‍රහස්පතින්දා | 2014.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.21 | සිකුරාදා | 2014.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.28 | සිකුරාදා | 2014.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2014.03.07 | සිකුරාදා | 2014.02.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.14 | සිකුරාදා | 2014.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.21 | සිකුරාදා | 2014.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.03.28 | සිකුරාදා | 2014.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.